# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2269/33 - 2022 මාර්තු මස 02 වැනි බදාදා - 2022.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත (සංශෝධන)

1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍ය ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් සාදන ලද නියෝග.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති,
ආරක්ෂක අමාත්‍ය.

2022 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2021.12.08 දිනැති අංක 2257/32 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මඟින් සංශෝධන කරන ලද, අංක 23/5 දරන 1979.02.13 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද, 1979 පුපුරණ ද්‍රව්‍ය නියෝග වල පස්වන උපලේඛනයේ සඳහන් අන්තරායකාරී නෞකා භාණ්ඩ නිෂ්කාශන සම්බන්ධ අවසරපත්‍ර සඳහා වූ අදාල ගාස්තු අයකිරීමේ 05 වන කාරණය වන “ගිනි අවි සමඟ ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුළුවන නැව් සඳහා අවසර පත්‍ර ගාස්තුව” වෙනුවට පහත පරිදි කරුණු ඇතුළත් කරමින් සංශෝධනය කරනු ලැබේ.

| *අ/අ* | *අන්තරායකාරී නෞකා භාණ්ඩ නිෂ්කාශන සම්බන්ධ අවසරපත්‍ර* | *අදාළ අවසර පත්‍ර ගාස්තුව රුපියල්* |
|---|---|---|
| 5 | ගිනිඅවි සමඟ ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරයට හෝ අභ්‍යන්තර ජල තීරයට (ගොඩබිම සිට නාවික සැතපුම් 12 දක්වා වූ කලාපයට හෝ ශ්‍රී ලංකාවේ වරායවල් හෝ ඉන්දු-ශ්‍රී ලංකා ජාත්‍යන්තර සමුද්‍ර මායිම් රේඛාවට ඇතුළතින් වූ ශ්‍රී ලංකාවට අයත් වූ කලාපය) ඇතුළු වන නැව්/යාත්‍රා සහ ගිනිඅවි පටවා ගැනීමේ අරමුණින් ඉහත සඳහන් කලාපයන් වෙත ඇතුළු වන නැව්/යාත්‍රා සඳහා අවසර පත්‍ර ගාස්තුව | රු. 10,000.00 |

EOG 03-0710

1A - G 036242— 15 (2022/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.